*G. G. Arulpragasam*
Attorney-at-Law & Notary Public
&
Commissioner of Oaths
No. 93, Hulftsdorf Street,
Colombo-12.

**<u>කොළඹ දිසා අධිකරණයේ දී ය.</u>**

නිහාල් ශ්‍රී අමරසේකර,
167/4, ශ්‍රී විපුලසේන මාවත
කොළඹ 10.

<u>පැමිණිලිකරු.</u>

නඩු අංකය: 21819/MR.

– එදිරිව –

1. ගාමිනි ලක්ෂ්මන් පීරිස්
විසුම්පාය, ස්ටේපල්ස් වීදිය
කොළඹ 2.
සහ කිරුළ පෙදෙස,
කොළඹ 5.

2. හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්,
කළම්බු හිල්ටන් ස්පෝර්ට්ස් කම්ප්ලෙක්ස් බාරේ
එචිලන් චතුරශ්‍රය,
ලෝටස් පාර,
කොළඹ 1.

<u>විත්තිකරුවෝ.</u>

1999 ජනවාරි මස 21 දින වන මෙදින දී ය.

ස්වකීය නීතිඥ **ජී.ජී. අරුල්ප්‍රගාසම්** මගින් පෙනී සිටින ඉහත නම සඳහන් 2 වන විත්තිකරුගේ උත්තරයෙන් මෙසේ ප්‍රකාශ වේ:-

01. දෙවන විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂවරුන් සිතාමතාම සහ අසද්භාවයෙන් සමාගමේ සම්බන්ධතාවන් සුරැකීමට සහ ආරක්ෂා කිරීමට පැහැර හැර ඇති බව පැමිණිලිකරු විසින් ඔප්පු කළ හැකිනම් මිස දෙවන විත්තිකරු වෙනුවෙන් මේ නඩුව පවත්වාගෙන යාමට පැමිණිලිකරුට හිමිකම නැති බව මූලික විරෝධතා වශයෙන් දෙවන විත්තිකරු ප්‍රකාශ කරයි. දෙවන විත්තිකරුගේ අධ්‍යක්ෂවරුන්ගේ තීරණවලට හේතු හෝ පෙළඹීම් ප්‍රකාශ කිරීමට නොහැකි නිසා පැමිණිල්ලේ ඔවුන්ට විරුද්ධව කර ඇති ප්‍රකාශවලට පිළිතුරු වූ ද මේ නඩුව පවත්වාගෙන යාමට පැමිණිලිකරුට ඇති අයිතිවාසිකමම තීරණය වන්නා වූද පිළිතුරු දීමට හැකි තත්ත්වයක දෙවන විත්තිකරු නොසිටින බව දෙවන විත්තිකරු කියා සිටියි. එමනිසා දෙවන විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂවරුන් නඩුවට පාර්ශ්වකරුවන් කිරීමට පැමිණිලිකරු අසමත්වීමේ හේතුවෙන් නඩුව නිෂ්ප්‍රභ කිරීම අවශ්‍ය වන බව දෙවන විත්තිකරු ප්‍රකාශ කරයි.

02. මෙහි මින්මතු පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති මූලික විරෝධතාවයට හානියක් නොමැතිව පැමිණිල්ලේ කර ඇති ප්‍රකාශවලට පිළිතුරු වශයෙන් දෙවන විත්තිකරු පහත සඳහන් පරිදි ප්‍රකාශ කරයි.

03. මෙහි මින්මතු නිශ්චිතව පිළිගෙන ඇති ප්‍රකාශ හැර පැමිණිලිකරුගේ පැමිණිල්ලේ කර ඇති නොයෙකුත් සියළු සහ එක් එක් හා සෑම ප්‍රකාශයක්ම දෙවන විත්තිකරු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. දෙවන විත්තිකරු පැමිණිල්ලේ 3, 4, 5, 6, 9, සහ 16 වන ඡේදවල අඩංගු දේ පිළිගනියි.

05. දෙවන විත්තිකරු පැමිණිල්ලේ 1 වන ඡේදයේ අඩංගු දේ පිළිගන්නා නමුත් දෙවන විත්තිකරුට විරුද්ධව නඩු නිමිත්තක් පැමිණිලිකරුට ඇතැයි යන්න ප්‍රතික්ෂේප කරයි.

06. 2 වන විත්තිකරු පැමිණිල්ලේ දෙවන ඡේදයේ අඩංගු දේ ගැන දන්නා නමුත් පැමිණිලිකරු මුදල් අමාත්‍යාංශයේ උපදේශක වශයෙන් "දිගටම කටයුතු නොකිරීමට අදහස් කළ බව" හෝ නොකළ බව නොදන්නේ යැයි ප්‍රකාශ කරයි.

07. 7(ඇ) ඡේදයේ ඇති ප්‍රකාශ හැර පැමිණිල්ලේ 7 වන ඡේදයේ අඩංගු දේ දෙවන විත්තිකරු පිළිගනියි. එහි සඳහන් කැබිනට් සංදේශය තිබෙන බව හෝ එහි අඩංගු දේ ගැන දෙවන විත්තිකරු නොදන්නා බව දෙවන විත්තිකරු ප්‍රකා ශ කරයි.

08. පැමිණිල්ලේ 8 වන ඡේදයට පිළිතුරු දෙන දෙවන විත්තිකරු එහි සඳහන් විශේෂ ජනාධිපති කොමිෂන් සභාව ඉදිරියේ පැමිණිලිකරු සාක්ෂි දුන් බව දෙවන විත්තිකරු දන්නා අතර පැමිණිලිකරු විසින් එකී කොමිෂන් සභාව ඉදිරියේ තබන ලද නිශ්චිත කරුණු ගැන නොදන්නා බව ප්‍රකාශ කරයි.

09. පැමිණිල්ලේ 10 වන ඡේදයට පිළිතුරු දෙන දෙවන විත්තිකරු සමථය නිවේදනය කිරීම සඳහා පුවත්පත් සාකච්ඡාවක් පැවති බව දෙවන විත්තිකරු සාමාන්‍යයෙන් දන්නා අතර එහිදී පළමුවන විත්තිකරු විසින් කරන ලද ප්‍රකාශයේ නියම විස්තර දෙවන විත්තිකරු නොදන්නා බව ප්‍රකාශ කරයි.

10. පැමිණිල්ලේ 11 වන ඡේදයට පිළිතුරු දෙන මේ විත්තිකරු, සුරැකුම්පත් විනිමය කොමිෂන් සභාවේ එවකට සිටි සාමාජිකයන්ට විරුද්ධව ක්‍රියා කිරීම සඳහා වූ කොන්දේසියක් 95.06.28 වන දින අත්සන් කරන ලද සමථ ගිවිසුමේ ඇතුළත් කළ බව දෙවන විත්තිකරු දන්නා අතර මේ කොන්දේසිය ඊට පසුව 1996 ඔක්තෝබර් මාසයේ දී සමථ ගිවිසුමට පරිශිෂ්ඨයක් මගින් අස්කර ගන්නා ලද බව ප්‍රකාශ කරයි.

11. දෙවන විත්තිකරු පැමිණිල්ලේ 12 වන ඡේදයේ අඩංගු දේ ගැන නොදනියි.

12. පැමිණිල්ලේ 13 වන සහ 18 වන ඡේදවලට පිළිතුරු දෙන දෙවන විත්තිකරු සමථ ගිවිසුම් අත්හිටුවන ලද බව දෙවන විත්තිකරු දන්නා අතර එම ගිවිසුම් ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම සිදුවූ අවස්ථාගත කරුණු සම්බන්ධයෙන් 95.08.08 වන දින හැන්සාඩ් වාර්තාවෙහි වාර්තා කර ඇති දෙයෙහි ප්‍රමාණයට හැර එකී ගිවිසුම් අත්හිටුවීමට තුඩුදුන් හේතු හෝ පෙළඹවීම් ගැන දෙවන විත්තිකරු නොදන්නා බව ප්‍රකාශ කරයි.

13. දෙවන විත්තිකරු පැමිණිල්ලේ 14 වන ඡේදයේ අඩංගු දේ පිළිගනියි.

14. පැමිණිල්ලේ 15 වන ඡේදයට පිළිතුරු දෙන මේ විත්තිකරු –

(අ) පැමිණිල්ලේ 15(අ) ඡේදයේ අඩංගු දේ පිළිගනියි.

(ආ) 15(ආ) ඡේදයට පිළිතුරු දෙමින් 3 වන කළමණ ඉදිකිරීම සඳහා සහ මුදල් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා සමථ ගිවිසුමේ ගතත්තියක් ඇතුළත් කරන ලද බව පිළිගන්නා ලද අතර එවැනි කාරණ අනුග්‍රහ කාල සීමාව ඇතුළත ක්‍රියාත්මක කළ හැකිව තිබුණේ ද යන්න ගැන ප්‍රකාශ කිරීමට නොහැකි ය.

(ඇ) පැමිණිල්ලේ 15(ඇ) ඡේදයට පිළිතුරු දෙන මේ විත්තිකරු [illegible] මේ විත්තිකරු නොදන්නා බව ප්‍රකාශ කරයි.

15. 17 වන ඡේදයේ අඩංගු දේ ගැන දෙවන විත්තිකරු සාමාන්‍යයෙන් දන්නා අතර පැමිණිලිකරුගේ කාර්ය භාරය පිළිගෙන ඇද්ද නැද්ද යන වග නොදන්නා බව දෙවන විත්තිකරු ප්‍රකාශ කරයි.

16. මේ විත්තිකරු පැමිණිල්ලේ 19(අ)(I) සහ 19(අ)(II) ඡේදවල අඩංගු දේ පිළිගනියි. පැමිණිල්ලේ 19(ඇ)(I) ඡේදයට පිළිතුරු දෙන මේ විත්තිකරු 1997 ජූලි මාසයේ දී රු.මිලියන 288.567 ක මුදලක් වර්ෂයකට 12.5% ක පොළිය මත රජයෙන් ණයට ගැනීමට සිදුවූ බව පමණක් පිළිගනියි.

පැමිණිල්ලේ 19(ආ)(I), 19(ආ)(2), 19(ඇ)(III) සහ 19(ඈ) ඡේදවලට පිළිතුරු දෙන දෙවන විත්තිකරු තුන්වන කුළුණ ඉදිකිරීම සඳහා සහ මුදල් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා සමථ ගිවිසුමේ කොන්දේසි ඇතුළත් කළ බව පිළිගන්නා අතර එම කාරණා අනුග්‍රහ කාලසීමාව තුළ ක්‍රියාත්මක කළ හැකිව තිබුණේ ද යන්න ප්‍රකාශ කිරීමට නොහැකි බව ප්‍රකාශ කරයි.

17. පැමිණිල්ලේ 20 වන ඡේදයට පිළිතුරු දෙන දෙවන විත්තිකරු කෝනෙල් පෙ පෙරේරා මහතා විසින් පවරන ලද නඩු තිබුණු බව සහ එම නඩුවල විෂය කාරණා සම්බන්ධයෙන් දෙවන විත්තිකරුගේ ස්ථාවරය දක්වමින් විරෝධතා සහ උත්තර ඉදිරිපත් කළ බව දන්නා වග පමණක් පිළිගනියි.

18. දෙවන විත්තිකරු පැමිණිල්ලේ 21 වන සහ 22 වන ඡේදවල කර ඇති ප්‍රකාශ ගැන නොදනියි.

19. දෙවන විත්තිකරු පැමිණිල්ලේ 23(අ) සහ (ආ) ඡේදවල අඩංගු දේ පිළි ගනියි. කෙසේ වුව ද එහි 23(ඇ) ඡේදයේ අඩංගු දේ ගැන දෙවන විත්තිකරු නොදනියි.
පැමිණිල්ලේ 24(ආ ) ඡේදයේ අඩංගු දේ පිළිගන්නා අතර මේ විත්තිකරු 24(අ) ඡේදයේ අඩංගු දේ ගැන නොදනියි.

20. 25 වන ඡේදයට පිළිතුරු දෙන දෙවන විත්තිකරු එහි සඳහන් සංදේශය ගැන නොදන්නා බව ප්‍රකාශ කරයි.

21. පැමිණිල්ලේ 26 වන ඡේදයේ කර ඇති නොයෙකුත් ප්‍රකාශ වලට පිළිතුරු දෙන දෙවන විත්තිකරු එහි සඳහන් අඩංගු දේ ගැන නොදන්නා නමුත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සටහන් ස්ථිර කරනු ලැබුවහොත් මීස කාරණය

නීතිඥවරුන්ට යොමු නොකළ යුතු බවට සභාපති විසින් සමාගමේ ලේකම්වරුන්ට නිසි ලෙස උපදෙස් දී තිබූ බව ප්‍රකාශ කරයි.

22. පැමිණිල්ලේ 27(අ) ඡේදයේ අඩංගු දේ පිළිගන්නා දෙවන විත්තිකරු සමාගමේ අධ්‍යක්ෂවරුන්ට මුදල් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ තත්ත්ව දරන තැනැත්තන් සහ සමාගමේ යහපත ගැන සිතන වෙනත් ජ්‍යෙෂ්ඨ ව්‍යාපාරිකයන් ඇතුළත් වන බව ද එමනිසා එහි (ආ), (ඇ) සහ(ඈ) අනු ඡේදවල සඳහන් සමාගමේ අධ්‍යක්ෂවරුන් දෙවන විත්තිකාර සමාගමේ උපරිම යහපත සඳහා ක්‍රියා නොකළේ යැයි විශ්වාස කිරීමට හේතු නැති බව ද නිශ්චිතව ප්‍රකාශ කරයි.

23. පැමිණිල්ලේ 28 වන ඡේදයට පිළිතුරු දෙව දෙවන විත්තිකරු මෙසේ ප්‍රකාශ කරයි:–

( අ ) පැමිණිලිකරු සමාගමේ සක්‍රිය අධ්‍යක්ෂවරයකුව සිට ඇත.

( ආ ) ඔවුන් විසින් කළ යුතු යැයි නීතියෙන් නියමිත පරිදි දෙවන විත්තිකරුගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම සඳහා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ උපරිම යහපත සඳහා ක්‍රියා කර නැතැයි විශ්වාස කිරීමට දෙවන විත්තිකරුට හේතුවක් නැති බව දෙවන විත්තිකරු ප්‍රකාශ කරයි.

24. දෙවන විත්තිකරු පැමිණිල්ලේ 29 වන ඡේදයේ අඩංගු දේ ගැන නොදනියි.

25. පැමිණිල්ලේ 30 වන සහ 31 වන ඡේදවලට පිළිතුරු දෙන දෙවන විත්තිකරු සමාගමේ අධ්‍යක්ෂවරුන් සමාගමේ උපරිම යහපත සඳහා ක්‍රියා කිරීමට සිතා මතාම සහ අසද්භාවයෙන් පැහැර හැර ඇති බව පැමිණිලිකරු විසින් ඔප්පු කළ හැකිනම් මිස දෙවන විත්තිකරු වෙනුවෙන් මේ නඩුව ගෙන ඒමට නීත්‍යනුකූල අයිතිවාසිකමක් පැමිණිලිකරුට නැති බව දෙවන විත්තිකරු නැවතත් ප්‍රකාශ කරයි.

එමනිසා මේ විත්තිකරු අයැද සිටින්නේ :–

( අ ) පැමිණිලිකරුගේ නඩුව නිෂ්ප්‍රභ කරන ලෙස ;

( ආ ) නඩු ගාස්තු ප්‍රදානය කරන ලෙස ; සහ

( ඇ ) සුදුසු යැයි මේ අධිකරණයට පෙනී යන වෙනත් සහ වැඩිදුර සහන ප්‍රදානය කරන ලෙස ය.

දෙවන විත්තිකරුගේ නීතිඥ.

G.G. ARU[illegible]SAM
Attorney-at-Law-Commissioner of Oaths
& Notary Public
Office : Nº 93, Hulftsdorp Street,
Colombo 12, Sri Lanka